# අධ්‍යාපනපති සාමාන්‍ය (පූර්ණකාලීන) පාඨමාලාව Master of Education in General (Full Time) Course - 2017/2018 (සිංහල මාධ්‍යය)

# අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනපති (පූර්ණකාලීන) පාඨමාලාව Master of Education in Educational Management (Full Time) Course - 2017/2018 (සිංහල මාධ්‍යය)

# අධ්‍යාපනික හා සංවර්ධන මනෝවිද්‍යාව පිළිබඳ අධ්‍යාපනපති (පූර්ණකාලීන) පාඨමාලාව Master of Education in Educational and Development Psychology (Full Time) Course - 2017/2018 (සිංහල මාධ්‍යය)

## අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

---

### හැඳින්වීම

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨය මගින් පවත්වනු ලබන, අධ්‍යාපනපති සාමාන්‍ය (පූර්ණකාලීන) පාඨමාලාව අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ ගුරුවරුන්/ විෂයමාලා සම්පාදකයින් /පරිපාලකයින් / කළමනාකරුවන් ගේ විශේෂඥතාව උදෙසා සැකසුන පාඨමාලාවකි. මෙම පාඨමාලාව හැදෑරීමට තෝරාගැනීම සඳහා රජයේ හෝ පෞද්ගලික අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවයේ නියුතු අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පූර්ණකාලීන පාඨමාලාවක් නිසා නිවාඩු හිමිකම් ඇති අය පමණක් අයදුම් කළයුතු වේ.

### පාඨමාලාවේ අරමුණු

1. අධ්‍යාපනයේ විවිධ ක්ෂේත්‍ර පිළිබඳ විශේෂඥතාව ඇති කිරීම
2. අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින විවිධ ගැටළු විසඳීමේලා පර්යේෂණ අනාවරණ උදෙසා යහපත් දැනුම කුසලතා හා ආකල්ප ඇතිකිරීම
3. ශාස්ත්‍රීය රචනය උදෙසා ප්‍රවීණතා ඇතිකිරීම
4. අධ්‍යාපන ක්ෂේත්‍රයේ උසස් සේවා සඳහා අවශ්‍ය යහපත් දැනුම කුසලතා හා ආකල්ප ඇතිකිරීම

### පාඨමාලා කාලය

මෙම පාඨමාලාව එක් අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාවකි, සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පැවැත්වේ. 80 % ක පැමිණීම අනිවාර්ය වේ. පූර්ණ කාලීන අධ්‍යයන නිවාඩු ලබා ගැනීම ඔබගේ වගකීමකි.

පාඨමාලාව පැවැත්වෙන භාෂා මාධ්‍යය : මෙම පාඨමාලාවන් සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙයි. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ හැකියාව වැදගත්වේ.

### පාඨමාලාවට ඇතුළුවීමට සුදුසුකම්

**පළමුවන වර්ගය :-** කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනවේදී (පළමුවන පෙළ/ දෙවන පෙළ) උපාධි සහතිකය හෝ පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සහිතව කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව විශිෂ්ඨ හෝ සම්මාන සහිතව සමත්වීම.

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඒ හා සමාන සුදුසුකම් සපුරා තිබීම

**දෙවන වර්ගය :-** කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණයේදී වෘත්තීය විෂයන් සඳහා අවම වශයෙන් “A” හෝ “B” ශ්‍රේණියේ සමාර්ථ්‍ය හයක් (6) සහිතව උපාධිය එකවර සමත්වීම.

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය සමත්ව, කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා විභාගයේදී අවම වශයෙන් “A” හෝ “B” ශ්‍රේණියේ සමාර්ථ්‍ය (6) සහිතව ඩිප්ලෝමාව <u>එකවර</u> සමත්වී තිබීම.

**පාඨමාලා ගාස්තුව** රු. 85,000/- කි.

පාඨමාලා ගාස්තුව පාඨමාලාව ආරම්භයේදී එකවර ගෙවා පාඨමාලාව සඳහා ලියාපදිංචි විය යුතුය. පාඨමාලා ගාස්තු ගෙවූ පසු, නැවත අයදුම්කරු වෙත ආපසු ගෙවනු නො ලබන බව සලකන්න.

පාඨමාලාව සඳහා බඳවාගැනීමට අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇතිවිට, තෝරා ගැනීමේ විභාගයක් සහ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා, ඉහළම ලකුණු ලබන අයදුම්කරුවන් පමණක් තෝරාගනු ලැබේ.

**පාඨමාලාවට අදාළ තොරතුරු විමසීම්**

පාඨමාලාවට අදාළ තොරතුරු,

කොළඹ විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය පිරික්සීමෙන් ලබාගත හැකිය. (www.cmb.ac.lk)

නැතහොත්,

0112588812 දුරකථන අංකය ඇමතීමෙන් ලබාගත හැකිය.

**පාඨමාලාව සඳහා අයදුම් කරන ආකාරය**

අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ 03 වෙතින් හෝ විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ලබා ගත් අයදුම්පත්, පහත සඳහන් අදාල පාඨමාලාවේ මහජන බැංකුවේ කොළඹ විශ්වවිද්‍යාලයේ ගිණුම් අංකයට රු.750/- ක මුදලක් ගෙවනු ලැබූ බැංකු වව්චරය (නිල මුද්‍රාව සහිතව) සමග නිසි ලෙස සම්පූර්න කරන ලද අයදුම්පත්‍රය පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ පැමින බාරදිය හැකිය. (වව්චරයේ පිටපතක් තමා ළඟ තබා ගැනීම වැදගත් වනු ඇත.)

- Master of Education in General (Full Time) Course - 2017/2018 (Sinhala Medium) **Account No. 206147100003**
- Master of Education in Educational and Development Psychology (Full Time) Course - 2017/2018 (Sinhala Medium) **Account No.206177500006**
- Master of Education in Educational Management (Full Time) Course - 2017/2018 (Sinhala Medium) **Account No.206177600005**

**අයදුම්පත් බාර ගැනීමේ අවසාන දිනය**

2017 මැයි මස 31 වන දින හෝ ඊට පෙර නිසි ලෙස සම්පූර්න කරන ලද අයදුම්පත්‍රය (රු. 30 සහ රු. 40 ක වටිනාකමින් යුත් මුද්දර ගැසූ සෙ.මී. 22 X 10 ප්‍රමාණයේ තම පෞද්ගලික ලිපිනය ලියූ ලියුම් කවර දෙකක් සහිතව) පහත සඳහන් ලිපිනයට අතින් හෝ ලියාපදංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන පාඨමාලාව සඳහන් කරන්න උදා: “MEd/G/FT“ හෝ “MEd/Edu. Dev. Psy./FT“ හෝ “MEd/Edu. Mgt./FT“ යනුවෙන් සඳහන් කරන්න.

- Master of Education in General (Full Time) Course (MEd/G/FT)
- Master of Education in Educational and Development Psychology (Full Time) Course (MEd/Edu. Dev. Psy./FT)
- Master of Education in Educational Management (Full Time) Course (MEd/Edu. Mgt./FT)

උදා.

| |
|---|
| පාඨමාලා සම්බන්ධීකාරක<br>MEd/G/FT<br>අධ්‍යාපන පීඨය<br>කොළඹ විශ්වවිද්‍යාලය<br>කුමාරතුංග මාවත<br>කොළඹ 03 |

**පාඨමාලා ආරම්භ කිරීම (2017/2018 පාඨමාලාව)**

තෝරාගැනීමේ විභාගය සහ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය කොළඹ විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියෙහි පළකරන අතර (www.cmb.ac.lk) ඊට අමතරව අයදුම්කරුවන් වෙත තැපැල් මගින් දන්වනු ලැබේ.